# සංරක්ෂණය අවැසි හෝර්ටන්තැන්න

පාරිසරික වශයෙන් වඩාත් සංවේදී ජෛව විවිධත්වයකට උරුමකම් කියනු ලබන ස්ථාන (Hot spot) අතුරින් දකුණු ආසියාවේ ඉහළම ජෛව විවිධත්වය හිමි රට ලෙසින් සුවිශේෂී ස්ථානයක් හිමිවනුයේ ශ්‍රී ලංකාවටයි. මෙම සිරිලක සිව් දෙස ඇති මනස්කාන්ත ශාඛ, සත්ව ප්‍රජාව මෙන්ම ස්වාභාවික රක්ෂිත අභය භූමි සහ දැඩි රක්ෂිත නිසාම ශ්‍රී ලංකාව ඉහළ ස්ථානයක් හිමි කර ගනී. ඓතිහාසික තොරතුරු විමර්ශනයේදී ශ්‍රී ලංකාවේ වන ජීවීන් ඇතුළු ස්වාභාවික සම්පත් සංරක්ෂණ ක්‍රියාවලිය ක්‍රි.පූ. 3 වන සියවස තරම් දිගු ඉතිහාසයක් කරා දිව යයි. මහින්දාගමනයට පසු කාලයේ දේවානම්පියතිස්ස රජු විසින් මහාමෙව්නා උයන සහ මිහින්තලය යන කලාපය සත්ව හිංසාවෙන් තොර අභය භූමියක් ලෙස ප්‍රකාශට පත් කිරීම "වන ජීවී ආරක්ෂිත" සංරක්ෂණයේ ප්‍රථම අවස්ථාව ලෙස සැලකිය හැකිය. ශ්‍රී ලංකාවේ දැනට ප්‍රකාශිත ජාතික වනෝද්‍යාන 16 ක් දේශීය ජෛව විවිධත්ව සංරක්ෂණ හමුවේ විශාල පිටිවහලක් සපයන අතර එකී වන උයන් අතර හෝර්ටන්තැන්න ජාතික වනෝද්‍යානයට හිමි වනුයේ ප්‍රමුඛ ස්ථානයකි. කඳුකරයේ පිහිටි එකම වනෝද්‍යානය වන නිසා, භූගෝලීය පිහිටීම දේශගුණික විවිධත්වය හා එහි ඇති ඓතිහාසික වටිනාකම නිසාම හෝර්ටන්තැන්න වත්මනෙහි සංචාරක පාරාදීසයක් ලෙස නම් කළ හැකිවේ.

## ශ්‍රී ලංකාව තුළ හෝර්ටන්තැන්නේ ඓතිහාසික මුහුණුවර හා භූගෝලීය පසුබිම :-

මෙය ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ පිහිටි එකම ජාතික වනෝද්‍යානය වන අතර 1961- 1969 අතර කාලවකවානුවේදී වගා බිමක් වශයෙන් පැවතුණි. ඉන් පසු එය ස්වාභාවික රක්ෂිතයක් ලෙස පැවතියද මෙහි ඇති ඉහළ ජෛවීය විවිධත්වය නිසාම 1988 වන විට ජාතික වනෝද්‍යානයක් බවට පත් කරන ලදී. මෙහි භූමි ප්‍රමාණය හෙක්ටයාර් 3,159.8 (ව.කි. 32) ක ප්‍රමාණයක් වන අතර එහි පිහිටීම උතුරු අක්ෂාංශ $6^0,45^0$ - $6^0,50^0$ ද හා නැගෙනහිර දේශාංශ $80^0,46^0$ - $80^0,50^0$ අතර නිරපේක්ෂ පිහිටීමකින් යුතු වේ. හෝර්ටන්තැන්න රත්නපුර දිස්ත්‍රික්කයට හා බදුල්ල යන දිස්ත්‍රික්කවලට මායිම් වේ. මෙම වනෝද්‍යානයට පිවිසීම සලකා බලන විට ප්‍රධාන මාර්ග 3 ක් ඔස්සේ එයට පිවිසීමට හැකි බව අවධාරණය කළ හැක.



ඡායාරූපය- අසංක විජේවර්ධන

පළාත තුළ හෝර්ටන්තැන්නේ පිහිටීම

## හෝර්ටන්තැන්න ජාතික උද්‍යානයේ ජෛවීය වැදගත්කම:-

හෝර්ටන්තැන්නේ ව්‍යාප්තව ඇති ජෛව සම්පත් ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් යටතේ වර්ග කළ හැක.

* ශාක ප්‍රජාව
* සත්ත්ව ප්‍රජාව

ශාක ප්‍රජාව ප්‍රධාන වශයෙන් ඉහළ කඳුකර වර්ෂා වනාන්තර හා තෙත් පතන වනාන්තර ආදී වශයෙන් වර්ග කරනු ලබයි. විවිධ කාලවකවානු තුල ලෝකයේම විද්වතුන්ගේ ඇස ගැටුණු මෙම හෝර්ටන්තැන්න කලාපය ගවේෂණ කළ හා නොකළ ඇතැම් ස්වාභාවික කරුණු මත කොටස් දෙකකට බෙදා අධ්‍යයනය සිදු කළ හැක. ඒ සියලු බෙදීම් අතරින් "සංරක්ෂණය සඳහා පානගමු" සංවිධානයේ විජේසුන්දර මහතා 1992 වසරේදී හෝර්ටන්තැන්නේ ව්‍යාප්තව ඇති ශාක ප්‍රජාව කොටස් 7 ක් යටතේ සම්පිණ්ඩනය කර ඇත.

* ඉහළ කඳුකර වැසි වනාන්තර
* තෙත් පතන තණ බිම්
* වගුරු හා ජලජ ප්‍රදේශවල ශාක
* වනාන්තර තෘණ බිම්
* වනාන්තර විවෘත බිම්
* තෘණ බිම් වල හානි වු තැන්
* මං මාවත් දෙපස හා ගොඩනැගිලි අවට ව්‍යාප්තව ඇති ශාක වශයෙනි.





හෝර්ටන්තැන්න පිළිබඳ කරන විවිධ පර්යේෂණ හමුවේ එළඹිය හැකි පොදු පොදු නිගමනය වන්නේ මෙම පරිසර පද්ධතිය තුළ ශ්‍රී ලංකාවට පමණක් ආවේණික වූ ශාක විශේෂ 49ක් පවතින අතර හෝර්ටන්තැන්න ශාක විශේෂ 101 පමණ ඇති බවත්ය. එම ශාක වල පොදු ලක්‍ෂණය ලෙස කුරු වනාන්තර ස්වාභාවය (Pigmy Forest) දැක්වීමට පිළිවන. හෝර්ටන්තැන්න ප්‍රදේශයේ පවතින දැඩි සුළඟට ඔරොත්තු දීමට මේ අයුරින් ශාක අනුවර්තනය වී ඇත. මීටර් 12 - මීටර් 15 අතර උසකට වැඩෙන මේ ශාක මුදුන කුඩයක හැඩයට වර්ධනය වී ඇත. පත්‍ර කුඩා වේ. ඒවා ඝනකම් ලෝහ වැස්මකින් ආවරණය වී හෝ දිලිසෙන හෝ වර්ණවත් පෘෂ්ඨයකින් යුක්තවේ. එය උත්ස්වේදනය අවම කර ගන්නට හැකි ලෙස අනුවර්තනය වී ඇත. හෝර්ටන්තැන්නේ ව්‍යාප්ත වී ඇති ශාක ප්‍රජාව ඒවාට අවේණික සුවිශේෂී ලක්‍ෂණ අනුව විවිධ අයුරින් වර්ග කළ හැකි වේ.

වනාන්තර ආශ්‍රිත ශාකඃ-


හෝර්ටන්තැන්න වනාන්තරය තුළ දඹ, කීන, වෙරළු, ලුනු අන්කෙන්ද, පොල්කටුගස්, දවුල් කුරුඳු, වල්කුරුඳු, සීතාපේර, මහ රත්මල්, නෙලූ,වෙනිවැල්, කැටමිල්ල, වැනි ශාක විශේෂ හඳුනාගත හැකිය. ශාකවල පත්‍රවල ස්වාභාවය, උස, ඝනකම, පැහැය, සපුෂ්පීය බව, උත්ස්වේදනය සිදුකරන ස්වාභාවය අනුව මේවා අනෙකුත් ශාක අතරින් සුවිශේෂී වේ.

හෝර්ටන්තැන්න පුරාම ඉතා හොඳින් ව්‍යාප්තව ඇති ජෛවීය වටිනාකමක් ඇති ඉතා සුන්දර ශාකයක් ලෙස මහ රත්මල් ශාකය හඳුන්වා දිය හැකිය. මෙය වඩාත් හොඳින් ව්‍යාප්තව ඇත්තේ තෘණ භූමිවලය. මෙය උසින් අඩි 2 ක් පමණ කුඩා ශාකවල පටන් වනාන්තරය ඇතුලතදී අඩි 10-15ක් අතර තරම් විශාල ශාක ලෙස වැඩී වර්ධනය වී ඇති ස්වභාවයක් දැකිය හැකිය. මෙහි පත්‍ර ඉතා ඝනකම් බවක් උසුලන බැවින් හෝර්ටන්තැන්න තුල ඇති වන ගිනිගැනීම්වලට හොඳින් ඔරොත්තු දෙන්නට මෙම ශාකය අනුවර්තනය වී ඇත. දීප්තිමත් රතු පැහැයක් ගන්නා මෙම මල් ඕවිලාකාර වන අතර එක පොකුරක සාමාන්‍යයෙන් මල් 15 ක් 20ක් අතර ප්‍රමාණයක් දැකිය හැකිය



මහ රත්මල්
Actinodaphne Speciosa

හෝර්ටන්තැන්න තුල ඖෂධීය වටිනාකමින් යුතු සුවිශේෂී පැළෑටි රාශියක් දැකිය හැකිය. ඒවා අතරින් මහ හැඩයා, වෙනිවැල් ආදිය ප්‍රධාන වේ. මීට අමතරව කුරු උණ, බටලී, ආදී බම්බු විශේෂ ද හෝර්ටන්තැන්නේ සුලභ ශාක වේ. මෙහි ශාක පිළිබඳව විශ්ලේෂණයේ දී ඒවා තෘණ බිම් ශාක, ජලජ ශාක, මී වන මෙන්ම උඩවැඩියා විශේෂ ලෙස ද හඳුනාගැනීමට පිළිවන් වේ. උඩවැඩියා විශේෂ 33 ක් පමණ හෝර්ටන්තැන්නේ දැකිය හැකි වුවද ඉන් 16ක්ම ශ්‍රී ලංකාවට පමණක් අවේණික ඒවා පමණක් වේ. උඩවැඩියා විශේෂ සඳහා සුදුසු භෞතික පරිසරයක් හෝර්ටන්තැන්නේ පැවතීම මේ තත්වයට හේතු වී ඇත. බේකර්ස් ඇල්ල ආශ්‍රිතව ශාක කඳන් මත වැඩෙන එවැනි උඩවැඩියා විශේෂ කිහිපයක් ම නිරීක්‍ෂණය කළ හැකිය. හෝර්ටන්තැන්න වන උයනේ අභ්‍යන්තරයේ දැකිය හැකි දිය ඇලි 2 අතරින් ප්‍රධාන වන්නේ බේකර්ස් දියඇල්ලයි.



හෝර්ටන්තැන්න සුන්දර කරන බේකර්ස් ඇල්ල

හෝර්ටන්තැන්න වනෝද්‍යානයේ දැකිය හැකි තෘණ බිම් ශාක අතරින් මහ සුදන, කුඩා සුදන, බටර් කප්, නිල් බිනර, සුදු බිනර, වල් එඬරු, කඳුලැස්ස, ගැටැස්ස, කොක්මොට, කිඩාරම්,

කුඩළු ආදී ශාක සුලභව දැකිය හැකිවේ. 2001 වසර සමඟ සසඳා බලන විට 2003 වන විට මෙම ශාකි වල වර්ධනය සීමාසහිත වීමක් පවතින බව අවධාරණය කළ හැකිය. එසේ නම් මෙම ශාක ප්‍රජාව පාරිසරික වටිනාකමින් වඩා ඉහළ ස්ථානයක පවතින බැවින් මේවා මතු පරපුර සඳහා සංරක්ෂණය කළ යුතු වේ.

සත්ත්ව ප්‍රජාව :-

මීළඟට හෝර්ටන්තැන්න ආශ්‍රිතව අපට නිරීක්ෂණය කළ හැක්කේ සත්ත්ව ප්‍රජාවයි. තෘණ බිමේ සුලභ ශාකය වන මහ රත්මල් පඳුරු අතර සැඟවී සිටින මුඛය දෙපස කළු පැහැති දාර 2ක් ඇති කට කළුවා, සියුම් නිරීක්ෂණයේදී හඳුනා ගත හැකි වුවත් හෝර්ටන්තැන්නට පමණක් ආවේණික අං කටුස්සා (Ceratophra) දුලබ දසුනක් වේ. මෙහිදී ක්ෂීරපායි සත්ව විශේෂ 14ක් හඳුනාගෙන ඇත.




ඡායාරූපය - අසංක විජේවර්ධන

හෝර්ටන් තැන්නේ දැවැන්තයා ගෝනා
(Cervusuhicolor Sambur)

එසේම පක්ෂි විශේෂ 98ක් හඳුනාගෙන ඇති අතර ඉන් 27ක් ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂීන් වේ. එයින්ද 21 ක්ම හෝර්ටන්තැන්නේදී අපට දැකිය හැකි වේ.

වර්තමානයේදී 1500ක් පමණ ගහණයකින් යුත් හෝර්ටන්තැන්නේ විශාලත ම ක්ෂීරපායි සත්වයා වන්නේ ගෝනාය. අනෙකුත් ප්‍රදේශවල සිටින ගෝනුන්ට සාපේක්ෂව හෝර්ටන්තැන්නේ ගෝනා ඉතාමත් පෘෂ්ටිමත් වේ. රාත්‍රී කාලයේ දී තෘණ කරා ඇදෙන මෙම සත්ත්වයා විලෝපිකයින්ගෙන් ආරක්ෂාවීමේ උපක්‍රමයක් ලෙස රාත්‍රියේදී මෙසේ තෘණ බිම් කරා ඇදෙති. ලංකා කොටියා, ඕලූ මුවා, දියබල්ලා, වල් ඌරා, වලස් වඳුරා, රිළවා, ලේනා සහ හාවා ක්ෂීරපායින් හෝර්ටන්තැන්න වනෝද්‍යානයේ දී අපට හමුවන අතර ඉන් ප්‍රධාන විලෝපීය සත්ත්ව විශේෂය වන්නේ ලංකා කොටියා ය. මොවුන් ඉතාමත් පෘෂ්ටිමත් වන අතර සමේ කළු පුල්ලි ස්වභාවයක් පවතී. අනෙකුත් ක්ෂීරපායීන් වන මුවන්, ගෝනුන්, වඳුරන් සහ කුඩා සතුන් ආහාරයට ගැනීමේ දැඩි ගිජුකමක් දක්වන ලංකා කොටියා වියළි කලාපයේදී ගවයන්ද ස්වකීය ගොදුරු බවට පත් කර ගනී.



වළි කුකුළා
(Wild fow

හෝර්ටන්තැන්නේ පවතින්නා වු අධික සීතල සහ භූගෝලීය පිහිටුම නිසාම එහි උරග විශේෂ 6 ක් වැනි ඉතා සුළු ප්‍රමාණයකට සීමා වේ. එනමුත් උභය ජීවී විශේෂ 16-20 ක් අතර ප්‍රමාණයක් දැකීමට පිළිවන් වේ. මැඩියන්, ගෙම්බන් සහ පණු මැඩියන් ලෙස වර්ගීකරණය කළ හැකිවේ. මීලඟට හෝර්ටන් තැන්නේ බහුල වශයෙන් දැකිය හැක්කේ පක්ෂි විශේෂයන් ය. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වශයෙන් හඳුන්වන වළිකුකුළා හෝර්ටන් තැන්නේ බහුල වශයෙන් දැකිය හැකි අතර ඉතාමත් සුන්දර ශරීර ශෝභාවක් ඇති මොවුන් සාමාන්‍යයෙන් ලජ්ජාශීලී පක්ෂියකු ලෙස හඳුනා ගෙන ඇත. මීට අමතරව ශ්‍රී ලංකා උරුවන් තිරාසිකයා, මයිනා, පුංචි බිඟුහරයා, ශ්‍රී ලංකා වන රැව්යා, ශ්‍රී ලංකා නිලනමැසිමාරා, ශ්‍රී ලංකා සිතෑසියා ආදී කුරුළු විශේෂ හෝර්ටන් තැන්නේ කුරුළු පාරාදීසයක් මවන සොබා දහමේ අගනා මැවුම් කරුවෝ





## අන්‍ය ජෛව ප්‍රජාවට වඩා හෝර්ටන් තැන්න වෙනස් වන්නේ ඇයි?

ශාක සහ සත්ත්ව ප්‍රජාවේ සුවිශේෂී බාහිර රූපමය වෙනස්කම් ද පැහැදිලිව හඳුනා ගත හැකිය. කඳුකරයේ ඉතා හොඳින් වැඩෙන කිසිදු ශාකයක් මෙහි නොවැඩේ. ''නිදසුනක් ලෙස :- සයිප්‍රස්, පයිනස්, ටර්පන්ටයින් ආදිය'' එවැනි ශාක වලින් මෙම තෘණ භූමිවලට කිසිදු බලපෑමක් සිදුනොවේ. එනමුත් මහ රත්මල් ශාකය පමණක් අනෙකුත් ශාක අභිබවා ශීඝ්‍ර ලෙස ව්‍යාප්ත වීම සහ වර්ධනය හෝර්ටන් තැන්නේ දැකිය හැක.

## මිනිස් ක්‍රියාකාරකම් හෝර්ටන් තැන්නට බලපාන්නේ කෙසේද?

මෙහිදී ප්‍රධානතම ගැටළුව ලෙස හඳුනාගෙන ඇත්තේ හෝර්ටන් තැන්න වගා බිමක් ලෙස යොදා ගැනීමයි. ඇත්තෙන් ම පාංශු රක්ෂණයට මෙය තර්ජනයකි. විවිධ කෘමිනාශක භාවිතය, රසායනික පොහොර වර්ග වගා බිමෙහි භාවිතය,% හට ගන්නා හෝර්ටන් තැන්නේදී මිනිසුන් තම අවශ්‍යතාවය පරිදි ඕකිඩ්, නිල් බිනර, මහ රත්මල්, සුදු බිනර ආදී සුවිශේෂ ශාක විශේෂ උදුරාගෙන යාම නිසා එහි පරිසර පද්ධතීන්ට හානි පැමිණෙන බව නොරහසකි. එසේම අපද්‍රව්‍ය බැහැර කරලීමේ ක්‍රියාවලිය වනෝද්‍යානය නරඹන්නන් විසින් නිසි ලෙස සිදුනොකරති. පොලිතින් මලු, යෝගට් කෝප්ප, ප්ලාස්ටික් වතුර බෝතල්, සිගරැට් පෙට්ටි, සිගරැට් ලයිටර් ආදිය වනෝද්‍යානයට බැහැරලීම නිසා උග්‍ර පාරිසරික ගැටළුවක් උද්ගත වී ඇත. විශේෂයෙන්ම මෙවැනි වටිනා ශාක ප්‍රජාව "ලැව්ගිනි" හේතුවෙන් විනාශ වී යාම ස්වභාවිකව හෝ වක්‍රාකාරයෙන් සිදුවන පරිසර හානියකි. වන සතුන්ට ගල් ගැසීම, ජලාශවලට ගල් ගැසීම ආදිය තුළින් ද සතුන්ගේ ඒකාග්‍රතාව බිඳ වැටීම ඔවුන් වෙත සෘජු ලෙසම එල්ල කරනු ලබන අකටයුත්තක් වේ. හෝර්ටන් තැන්න තුළ අනන්‍යතාව සුරක්ෂිත කිරීමට කැපවී සිටින කාර්ය මණ්ඩලයේ උපදෙස්වලට පටහැනිව සිදුකරනු ලබන දැව දඬු කැපීම සහ අනවසර මැණික් ගැරීමට මිනිසා විසින් පරිසර පද්ධතිවල පැවැත්මට එල්ල කරන විශාල තර්ජනයකි.

## හෝර්ටන් තැන්න සංරක්ෂණයේදී මානව ක්‍රියාකාරකම් අවම කරන්නේ කෙසේද?

මෙහිදී වටිනා පරිසර පද්ධතියක් සංරක්ෂණය කිරීමට සෘජුවම මැදිහත්වීම කළ යුත්තේ මිනිසාමය. මොවුන් තුළ පවතින ආකල්ප,හැසිරීම මෙන්ම බුද්ධිමය දැනුවත්භාවයට ඇමතිය යුතුයි. මේ සඳහා විශාල කර්යභාරයක් වන ජීවී සංරක්ෂණ නිලධාරීන් වෙත පැවරී ඇත. එසේම පරිසර වටිනාකම් රක්ෂණය කරන්නා වූ සෑම අංශයක ම ඒ සඳහා උත්සුක විය යුතුය.

වර්තාමානයේ හෝර්ටන් වන පෙදෙස තුල බහුල නීති රීති සමුදායක් ක්‍රියාත්මක වේ. ඒවා අතර අපද්‍රව්‍ය රැගෙනයාමට ඉඩ නොදීම, සතුන් දඩයම සහ පැළෑටි ගැලවීම තහනම් කිරීම තෘණ බිම් තුළ ක්‍රීඩා කිරීම තහනම් කිරීම, වන උයන නැරඹීමට නිශ්චිත කාල පරාසයක් වෙන්කිරීම සහ ජනතාව තුළ මෙම වනෝද්‍යානය පිළිබඳව පවත්නා අල්ප දැනුම පුළුල් කිරීම ආදිය පැසසිය යුතු වේ. පාරිසරික වටිනාකම සහ දුර්ලභ පිවිසුම් මාර්ග නැරඹීමේ අවස්ථාව නිසාම මෙහි පැමිණෙන්නා වූ සංචාරකයින් ඖෂධීය වටිනාකමින් යුතු ශාක, ජානමය වටිනාකමින් යුත් සත්ත්ව කොට්ඨාශ වෙත දැඩි අවධානයක් යොමු කරන්නේ එනිසාය. මෙහිදී පරිසර විරෝධී ක්‍රියා කලාපයක් තුළින් ඔවුන්ගේ රටවල් කරා මෙම ස්වර්ණමය වස්තු මංකොල්ලය ප්‍රධාන ලෙස සංචාරකයන් අතින් සිදුවන්නා වූ ප්‍රබල වරදකි. නිදසුනක් ලෙස අපේ දේශීය බිනර මල ඕලන්දයට ගෙන ගොස් එහි පේටන්ට් අයිතිය ඔවුන් නතුකර ගැනීම මෙන්ම වෙනිවැල්, කොතලහිඹුටු, කෝමාරිකා ආදී ශාක සඳහා ද විදේශිකයන් විසින් ස්වකීය පේටන්ට් අයිතිය තහවුරු කරගෙන ඇත. එසේ නම් මේවා සංරක්ෂණය කිරීම එක් පාර්ශවයක් මඟින් පමණක් කළ හැකි දෙයක් නොවේ. ඒ සඳහා සමස්ත ප්‍රජාවගේ සැලකිය යුතු උනන්දුවක් සහ අවශ්‍යතාවයක් පැවතිය යුතුය. මෙම අසිරිමත් පරිසරයට පිවිසෙන ඔබට හෘදයාංගමව එහි හැසිරීම මෙවැනි දැන්වීම් පුවරුවක් මග පාදන්නේ එබැවිනි.

"ඔබ මේ පිවිසෙන්නේ මුහුදු මට්ටමේ සිට මීටර් 2300ක් ඉහළින් පිහිටියාවු හෝර්ටන් තැන්න ජාතික වනෝද්‍යානයටයි. එහි සුන්දරත්වය ජෛව විවිධත්වය ආරක්ෂා කරගැනීමට ඔබත් දායකවන්න."

සංරක්ෂණ බාධාවන්:-

මනුෂ්‍ය ක්‍රියාකාරකම් නිසා 1989 සහ 1998 වර්ෂවලදී හෝර්ටන් තැන්න වනෝද්‍යානයේ අභ්‍යන්තර හදිසි ගිනිගැනීම් ඇති වුණි. මෙහිදී හෝර්ටන් තැන්න විශාල වශයෙන් විනාශ විය. ඉන්පසුව එම හානි අවම කිරීම සඳහා නිර්මාණය කරන ලද ගිනි පටි (Fire Belts) වර්තමානය වන විට නිසි නඩත්තුවක් නොවීම නිසා නැවතත් ''ලැව්ගිනි'' අවධානම හෝර්ටන් තැන්න තුළ පවතින බව කිව යුතුය. එසේම හෝර්ටන් තැන්නට පිවිසීමේ ප්‍රධාන දොරටුව අභියස වන ජීවී කාර්යාලය පිහිටා ඇති වුවද හෝර්ටන් තැන්න භූමිය තුළ සංචාරකයින්ට ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාව පවතී. එනිසා ජංගම නිරීක්ෂණ කුටි විශේෂිත ස්ථාන තුළ පිහිටුවා තිබීම තුළින් සංචාරකයින් අතින් සිදුවන ඇතැම් වැරදි සහගත කටයුතු අවම කරගැනීමට පිළිවන් වේ. මෙය වර්තමානය වන විට අනිවාර්යයෙන්ම කළ යුතු තත්ත්වයක් බවට පත්වී ඇත. තවද පූර්ණ අධීක්ෂණයකින් පසු හෝර්ටන් තැන්නට ඇතුළු වන්නන් පිට වන විටද ඔවුන්ගේ සියළුම බඩු බාහිර ආදිය සමඟම නැවතත් අධීක්ෂණයට භාජනය කළ යුතුවේ. නොඑසේ නම් එමඟින් වටිනා ජෛව සම්පත් තම රටවලට ගෙන යාමේ තර්ජනයකට අප මුහුණ දෙනු ඇත. එසේම ඇතුලට ගෙන යන්නාවූ ප්ලාස්ටික් බෝතල් ආදිය ආරම්භක ස්ථානයේදී සටහන් කරගෙන නැවතත් පිටවන විටද පරීක්ෂා කිරීම තවත් එක් සංරක්ෂණ උපක්‍රමයකි. එනමුත් විවිධ තරාතිරමේ පුද්ගලයින් හෝර්ටන් තැන්න නැරඹීමට පැමිණෙන නිසා එවැනි ක්‍රියා මාර්ග ගැනීම ප්‍රායෝගිකව මන්දගාමී වේ. මෙවැනි අන්දමේ හඳුනාගත් ගැටළු රාශියකට පිළියම් දැඩි නීති රීති යටතේ ක්‍රියාත්මක කිරීම හෝර්ටන් තැන්න තවදුරටත් රැකගැනීමේ පියවරක් වේ. මිනිසුන්ට පනවන නීති රීති ආරක්ෂා කරන අය ඇගයීම මෙන්ම මේවා කඩ කරන පිරිසට දැඩි දඬුවම් පමුනුවාලීමට සාර්ථක උපක්‍රමයකි. මෙමඟින් හෝර්ටන් තැන්න තුළ ඇති වටිනා ස්වාභාවික සම්පත් ආරක්ෂා කරගත හැකි වේ.

ඉහත කරුණ වඩාත් සනාථ කිරීමට රොබට් නොක්ස් (Robert Knox) ගේ ''එදා හෙළ දිව '' කෘතිය මනා පිටුබලයක් සපයනු ලබයි. ඔහු එම කෘතියේ ශ්‍රී ලංකාවේ ඉහළ කඳුකර ප්‍රදේශ සියල්ලම සාමාන්‍ය ජනයාට තහනම් ප්‍රදේශ බවට පත් කරන්නට ඇත්තේ මනුෂ්‍ය ක්‍රියාකාරකම් තුළින් ඒවා විනාශ වන බව ඉවෙන් මෙන් දැන සිටි බැවිනි.

පරපුර වෙනුවෙන් සංරක්ෂණය කළ යුතු හෝර්ටන් තැන්න:-

වනාන්තර පරිසර පද්ධතියේ පැවැත්ම මත මිනිසුන්ගේ පැවැත්ම තීරණය වන බව දත් අපේ මුතුන් මිත්තෝ අනාගත පරපුර වෙනුවෙන් දිවි හිමියෙන් ඒවා රැකගත්හ. එසේ රැකගෙන වර්තමාන පරපුර වෙත භාර කළ වනාන්තරයක් ලෙස ''හෝර්ටන් තැන්න'' හඳුන්වා දිය හැකිය. එසේ නම් එය අතීත උරුමයකින් අප වෙත භාරදී ඇත්තේ එය භුක්ති විඳ එය අවසන් කිරීමට නොවේ. වර්තමාන පරපුර විසින් ආරක්ෂා කර අනාගත පරපුර වෙත අමිල වටිනාකමින් භාර කරන්නටය. එය අද වන විට අප විසින් ඉටු කරනවා ද යන්න දෙවරක් සිතා බැලිය යුතු කරුණකි. සුන්දර වන පියස වෙත ඔබ අප ඉටු කළ යුතු දේ බොහෝය. ඉටු නොකළ යුතු දේ බොහෝය. එසේ නම්, අනාගත පරපුර වෙනුවෙන් හෝර්ටන් තැන්න සංරක්ෂණය කිරීම මත හෝර්ටන් තැන්නේ සුපහන් අනාගතය තීරණය වනු ඇත.

(ලිඛිත මූලාශ්‍ර ඇසුරින්)

**S.D.** මුතුනායක
වැඩසටහන් සහකාර
(මාධ්‍ය) ප්‍රවර්ධන අංශය

